# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත

பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்

CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/03/01/i/පොදු | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2022.04 02 |
|---|---|---|---|---|---|

සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,

දකුණු පළාත.

**<u>පළාත් ලේකම්වරුන්ගේ විශේෂ සාකච්ඡාව - සාකච්ඡා සටහන යොමුව</u>**

උක්ත මැයෙන් නිකුත් කර ඇති, ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/3/6/MT/1 හා 2022.04.01 දිනැති ලිපිය හා බැඳේ.

02 ඒ අනුව ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.03.31 දින පැවති පළාත් ලේකම්වරුන්ගේ විශේෂ සාකච්ඡාවේදී සාකච්ඡා කළ කරුණු හා එළඹි තීරණ ඇතුලත් සාකච්ඡා සටහන මේ සමග ඔබ වෙත එවනු ලබන අතර, එහි ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකර එහි ප්‍රගතිය මටද පිටපතක් සහිතව ගරු ආණ්ඩුකාරතුමා වෙත වාර්තා කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

03 මේ සම්බන්ධයෙන් ඔබගේ යටත් ආයතනවල ආයතන ප්‍රධානීන් ද දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

ආර්. සී. ද සොයිසා,
ප්‍රධාන ලේකම්
දකුණු පළාත.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත :- ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, දකුණු පළාත - කරු. දැ.ගැ.ස


| ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary | 091 4944002 | කාර්යාලය / காரியாலயம் / Office | 091 4119011 / 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site | www.cs.sp.gov.lk |
|---|---|---|---|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

# පළාත් ලේකම්වරුන්ගේ විශේෂ සාකච්ඡාව

දිනය : 2022.03.31

වේලාව : ප.ව.3.00

ස්ථානය : ආණ්ඩුකාර ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරය

ප්‍රධානත්වය : දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර ආචාර්ය ඩබ්.ඩබ්. ගමගේ මැතිතුමා

සහභාගීත්වය

1. ප්‍රධාන ලේකම්, දකුණු පළාත
2. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව
3. ලේකම්, දකුණු පළාත් සභාව
4. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, දකුණු පළාත
5. ලේකම්, අධ්‍යාපන ...අමාත්‍යාංශය, දකුණු පළාත
6. ලේකම්, කෘෂිකර්ම ...අමාත්‍යාංශය, දකුණු පළාත
7. ලේකම්, ක්‍රීඩා ...අමාත්‍යාංශය, දකුණු පළාත
8. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මුදල්, දකුණු පළාත
9. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පිරිස් හා පුහුණු , දකුණු පළාත
10. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - ඉංජිනේරු සේවා , දකුණු පළාත
11. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - සැලසුම් , දකුණු පළාත
12. සහකාර ලේකම්, ධීවර ...අමාත්‍යාංශය, දකුණු පළාත

## 01. පිළිගැනීම හා අරමුණ පැහැදිලි කිරීම

දකුණු පළාත් ප්‍රධාන ලේකම් විසින් සියළුම නිලධාරීන් පිලිගැනීමෙන් අනතුරුව ගරු ආණ්ඩුකාරතුමා වෙත සකාච්ඡාව පවත්වා ගෙන යාම සඳහා ආරාධනා කරන ලදී.

## 02. සාකච්ඡා කරන ලද කරුණු

| අනු අංකය | සාකච්ඡා කළ කරුණු | තීරණ | වගකීම |
|---|---|---|---|
| 01 | පවතින ඉන්ධන අර්බුදය හමුවේ ආයතන වල රාජකාරි කටයුතු සිදු කිරීම. | 1. බලශක්තිය කළමණාකරණය කර රාජ්‍ය සේවය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා පළාත් ආදායම් දෙපාර්තුමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තුමේන්තුව හැර දකුණු පළාත් සභාවේ සියළුම රාජ්‍ය ආයතන අප්‍රේල් 04 සිට මැයි 01 දක්වා අඟහරුවාදා සහ සිකුරාදා දින නිවසේ සිට රාජකාරි කටයුතු සිදු කිරීම.<br><br>2.අප්‍රේල් 04 සිට මැයි 01 දක්වා සියළුම සෙනසුරාදා දින, ඉරිදා දින ,පෝය දින සහ රජයේ නිවාඩු දිනවල සියළුම පළාත් සභා ආයතන විවෘත නොකිරීම. | - ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br>- සියළුම අමාත්‍යාංශ ලේකම්වරු<br>- සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br>- සියළුම දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් |

| | | | |
|---|---|---|---|
| | | <u>සැ.යු.</u><br>(i). නමුත් කාර්යාල වසා තබන අඟහරුවාදා හා සිකුරාදා දෙදින තුල සෑම නිලධාරියකුම මාර්ගගත (online) ක්‍රමය ඔස්සේ ස්වකීය රාජකාරියට අදාල කාර්යයන් නිවසේ සිට ඉටු කල යුතුය. එමෙන්ම එම දිනවල රජයේ සේවය ලබා ගැනීම සඳහා පැමිණෙන මහජනතාවට සහයවීම පිණිස වගකිවයුතු නිලධාරියකු සම්බන්ධීකරණ නිලධාරි වශයෙන් නම්කර, කාර්යාලය ඉදිරිපස රැඳවීමට දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා වගබලා යුතුය.<br>(ii). ඔහු විසින් පැමිණෙන මහජනතාවගේ අවශ්‍යතා හා ඉල්ලීම් ලේඛනගත කිරීමත් හා අදාළ නිලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීමත් සිදු කළ යුතුය.<br>(iii). එසේ ලේඛනගත කරගත් රාජකාරි කටයුතු සඳහා එළඹෙන පළමු රාජකාරි දිනය තුළම ප්‍රතිචාර දැක්වූ බවට සහතික වීම දෙපාර්තුමේන්තු/ ආයතන ප්‍රධානියාගේ වගකීමකි.<br>(iv). කාර්යාලය ඉදිරිපිට ආයතන ප්‍රධානියාගේ දුරකථන අංකය ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතුය. | |
| 02 | විශේෂ අවශ්‍යතා සහිත රාජ්‍ය නිලධාරීන් සේවයේ යොදවා ගැනීම | බලශක්තිය සීමා කිරීම හේතුවෙන් විදුලි සෝපානය භාවිතා කිරීමට නොහැකි වන බැවින් එම කාර්යාල වල ඉහල මහල් වල රාජකාරි කටයුතු කරන විශේෂ අවශ්‍යතා සහිත නිලධාරීන් සඳහා නිවසේ සිට වැඩ කිරීමේ පහසුකම ලබාදීම | - ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br>- සියළුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියළුම නියෝජ්‍ය ලේකම්වරු |
| 03 | රෝහල් සහ අත්‍යාවශ්‍ය ආයතනවල සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යාම | රෝහල් වැනි අත්‍යවශ්‍ය ආයතන වල සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම පිලිබඳව සාකච්ඡාවක් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් විදුලි බල මණ්ඩලය, ඛණිජ තෙල් සංස්ථාව වැනි අදාල සියළුම පාර්ශ්වයන් සම්බන්ධ කරගෙන 2022.04.01 දින පැවැත්වීම. | - ආණ්ඩුකාර ලේකම්, දකුණු පළාත |
| 04 | රැස්වීම් සඳහා නිලධාරීන් සහභාගී කර ගැනීම | හැකි සෑම අවස්ථාවකම මාර්ගගත ක්‍රමය ඔස්සේ සාකච්ඡා පැවැත්වීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය. | - ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br>- සියළුම අමාත්‍යාංශ ලේකම්වරු<br>- සියළුම නියෝජ්‍ය ලේකම්වරු |

**03.ස්තුතිය හා සාකච්ඡාව අවසන් කිරීම**

ගරු ආණ්ඩුකාරතුමා විසින් පැමිණ සිටි සියළුම නිලධාරීන්ට ස්තුතිය පළ කිරීමෙන් අනතුරුව සාකච්ඡාවේ කටයුතු නිමාවට පත් කරන ලදී.

දිලේබා කුඩාච්චි
ආණ්ඩුකාර ලේකම් (වැ. බ.)
දකුණු පළාත.